# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1476/2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி
දිනය / Date — 27/11/2023 පැය 0800

## මාධ්‍ය නිවේදනය

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඩුවෙල පොලිස් ස්ථානය.**

2023.11.26 වන දින දහවල් කාලයේ කඩුවෙල පොලිස් වසමේ හේවාගම ප්‍රදේශයේදී කඩුවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන හේවාගම, කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩුවෙල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - තොඩුවාව පොලිස් වසම.**

2023.11.26 වන දින සවස් කාලයේ තොඩුවාව පොලිස් වසමේ පුත්තලම කොළඹ මාර්ගයේ කිලෝමීටර් 60 කණුව අසලදී කොළඹ දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ මෝටර් රථයක් එම දෙසටම ධාවනය වූ පා පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු මාරවිල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ මහවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාරවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තොඩුවාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**